# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 245/5—1976 දෙසැම්බර් 29 වැනි බදාදා—1976.12.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත**

යා/නල්ලූර් අභ්‍යාස විද්‍යාලය—යාපනය සහ
යා/නල්ලූර් ලංකා සභා දෙමළ මිශ්‍ර පුහුණුවීමේ පාසල—යාපනය

**10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය**

අධ්‍යාපන අමාත්‍ය නැන්පත් බදිඋද්දීන් මහමුද් වන මම, 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පණතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අංක 12685 හා 1961. 09. 30 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ හා අංක 13209 හා 1962. 07. 13 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් සංශෝධනය කරන ලද, අංක 122 දරණ පැවරුම් නියෝගය, එහි අංක 1, 2 හා 3 වැනි ඡේදවල විස්තර කර ඇති ඉඩම් හා ගොඩනැගිලිවලට පමණක් අදාල වන තාක් දුරට 1961 වර්ෂයේ ඔක්තෝබර් මස 15 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

බදිඋද්දීන් මහමුද්,
අධ්‍යාපන ඇමති.

පාප 9/6,
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2,
1976 නොවැම්බර් මස 30 වෙනි දින.

12-76/1

---

**1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පණත**

10 වෙනි වගන්තිය යටතේ වූ නියෝගය

**යා/ඩ්‍රිබර්ග් විද්‍යාලය—චාවකච්චේරි**

අධ්‍යාපන අමාත්‍ය නැන්පත් බදිඋද්දීන් මහමුද් වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පණතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවැරී ඇති බලතල අනුව ක්‍රියා කරමින් 1962. 02. 28 වන දින අංක 12998 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙන් පළ වූ අංක 1145 දරණ පැවැරුම් නියෝගය මෙයට යාකර ඇති උපලේඛන යෙහි විස්තර කොට දක්වෙන දේපලවලට අදාළ වන තෙක් දුරට 1962 වර්ෂයේ අප්‍රේල් 15 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

බදිඋද්දීන් මහමුද්,
අධ්‍යාපන ඇමති.

අංකය: පාප/9/485,
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2,
1976. 10. 20.

**උපලේඛනය**

1960 වර්ෂයේ ජුලි මාසයේ 21 වන දින යා/ශ්‍රීබර්ග් විද්‍යාලය පවත්වා නඩත්තු කරන ලද ස්ථානය එනම්, බලය ලත් මිනින්දෝරු හා මට්ටම්කරු පී. ඒ. සේනාධිරාජා මහතා විසින් අඳින ලද 1962. 11. 12 දින අංක 53 දරණ පිඹුරෙහි රූඩ් 1, පර්. 34 ක් වූ ‘ බී ’ අක්ෂරය දරණ බිම් කොටස සම්පූර්ණයෙනි.

12-76/2

---

**1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පණත**

**10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය**

**කො/මාදම්පිටිය මෙතෝදිස්ත මිශ්‍ර පාසල—කොළඹ 14**

අධ්‍යාපන අමාත්‍ය නැන්පත් බදිඋද්දීන් මහමුද් වන මම, 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පණතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අංක 13304 හා 1962. 09. 15 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි (අති විශේෂ) පළ වූ අංක 1866 දරණ පැවරුම් නියෝගයෙහි උපලේඛනයේ 1 වන හා 2 වන ඡේදයන් 1968 ජනවාරි මස 8 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

බදිඋද්දීන් මහමුද්,
අධ්‍යාපන ඇමති.

පාප/2/ඒ-85
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2, 1976 පෙබරවාරි 19.
12-77

---

**1976 අංක 25 දරණ ජනාවාස පනත**

1 වෙනි වගන්තිය යටතේ නියමය

1976 අංක 25 දරණ ජනාවාස පනතේ 1 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම, මෙම නියමය මගින් ඉහත කී පනත ක්‍රියාත්මක වන දිනය වශයෙන් 1977 ජනවාරි මස 01 වෙනි දිනය නියම කරමි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකර්ම සහ ඉඩම් ඇමති.

1976 දෙසැම්බර් මස 29 දින,
කොළඹ දී ය.
12-85

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී